ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව - 2022
---------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.23,000ක විදුලි පංකාවක් ගිණුම්ගත නොතිබුණි. | වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,063,910ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,374,227ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 7,652 | 7,455 | 3,112 | 17,533 | 7,769 | 7,517 | 5,312 | 16,039 |
| කුලී | 7,330 | 6,288 | 5,929 | 1,700 | 6,708 | 5,125 | 5,127 | 1,709 |
| බලපත්‍ර ගාස්තු | 904 | 3,422 | 1,843 | 1,801 | 1,014 | 510 | 536 | 67 |
| වෙනත් ආදායම් | 1,596 | 4,654 | 4,654 | - | 17,213 | 19,488 | 41,164 | 20,022 |
| එකතුව | 17,482 | 21,819 | 15,538 | 21,034 | 32,704 | 32,640 | 52,139 | 37,837 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.16,393,700ක්, හිඟ අක්කර බදු රු.347,283ක්, හිඟ ජල බදු රු.674,426ක් සහ හිඟ කුලී රු.1,700,468ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වර්ෂ 5කට වරක් වරිපනම් බදු ප්‍රතිශෝධනය කළ යුතු වුවත් සභා බල ප්‍රදේශය තුළ 2015 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව මත 2022 වර්ෂයේ ද වරිපනම් බදු අය කර තිබුණි. | වරිපනම් තක්සේරුවක් සඳහා කටයුතු කරන බව. | යාවත්කාලීන තක්සේරුවකට අනුව ආදායම් අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව මඟින් පාලනය කරනු ලබන ජල ව්‍යාපෘතිය සඳහා ජල මීටර සවි කර නොතිබූ අතර මාසිකව රු.450 බැගින් වූ ස්ථාවර ගාස්තුවක් අය කරමින් පැවතුණි. | මහා සභාව වෙතින් අනුමැතියක් ලබා දී නොමැති බව. | අදාල ජල මීටර් කඩිනමින් සවි කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2022 වර්ෂයට ආරච්චිකට්ටුව හා මුන්දලම යන කොට්ඨාශ දෙකෙහි පමණක් ඩෙංගු රෝගීන් 109 වාර්තා වී තිබූ අතර ඩෙංගු මර්ධනය සඳහා පිරිසිදු කිරීමේ වැඩ සටහන් 4ක් පමණක් සිදු කර තිබුණි. | අවධානම් ප්‍රදේශ වෙත ප්‍රමුඛත්වය ලබා දෙන ලද බව. | සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුය. |
| (ඇ) | සභාව සතු නළ ළිං 94ක් පවතින බව ලේඛනවල සඳහන්ව ඇති නමුත් ඊට අදාළ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අතර නළ ළිං 03ක් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. | ඉදිරියට විගණනයේ උපදෙස් මත කටයුතු කරන බව. | අදාල දත්ත නිවැරදිව යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර ක්‍රියාත්මක තත්වයේ නොමැති නළ ළිං සම්බන්ධව කඩිනම් පියවර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම්වල වටිනාකම රු.33,683,061ක් වූ අතර එය තුල වර්ෂ 05ක් ඉක්මවූ ශේෂවල වටිනාකම රු.14,563,019ක් වූ අතර මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දි අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.3,208,218ක් වූ අතර ඉන් අවු:3ට වැඩි 5ට අඩු රු. 2,165,275ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දි නිරවුල් කිරිමට කටයුතු කරන බව. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් දේපළ 48ක් විය. | ඉදිරියේදී එය කඩිනම් කරන බව. | අදාළ දේපළ පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරික්ෂා කිරීමේදි අතිරික්තතා ලේඛනවලට ඇතුළත් කර නොතිබූ අතර ඌනතා සම්බන්ධයෙන් පියවරයන් ගෙන නොතිබුණි. | භාණ්ඩ වට්ටෝරු ලේඛනයට ඇතුලත් කිරීමට හා ඌනතාවයන් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා නිර්දේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ද්වීතියික තනතුරු 06ක්ද ප්‍රාථමික තනතුරු 11ක්ද පුරප්පාඩු වී තිබුණි. | මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව. | සභාවට අවශ්‍ය සේවක සංඛ්‍යාව නිවැරදිව හඳුනා ගෙන අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු වාහන 03ක් 2019 වර්ෂයේ සිට අළුත්වැඩියා සිදු කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර දිරාපත් වෙමින් පැවතුණි. | අපහරණ මණ්ඩලයේ වාර්තාව ලද පසු ඉදිරි කටයුතු සිදු කරන බව. | අළුත්වැඩියා සිදු කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 10ක් ඉටු කිරීම සඳහා රු.447,911ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා වූ චක්‍රලේඛයට අනුව වියදම් පාලනය කිරීමට සිදු වූ බව. | ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර ගැනීම සඳහා කටයුතු කල යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර අභ්‍යන්තර විගණනය විසින් අවධානය යොමු කර තිබුණේ අක්කර බදු , නිවාඩු හා ජල ව්‍යාපෘතිය පිළිබඳව පමණි. | 2023 වර්ෂයේදි නිසි පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන බව. | සියළු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විගණනය සැලසුම් කර විගණන කටයුතු සිදු කළ යුතුය. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟා වීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු 10ක් සඳහා ඉලක්කයන් හඳුනා ගෙන එයින් අරමුණු 06ක් පමණක් ඉටුකර තිබුණි. | වියදම් පාලනය කිරීම සිදුවූ නිසා ඉටුකිරීමට නොහැකි බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට කටයුතු කල යුතුය. |